## 185 වැරහැලි එල්ලා

වැරහැලි එල්ලා ගත් යාවකයින්
අප වෙත එන්නේ පිහිටක් සොයමින්
ඇයි අපි දුගියන් හරව යවන්නේ
ජේසුතුමන් නොවැ එලෙසින් එන්නේ

කුසගිනි දැනිලා වැහැරුනු සිරුරින්
බියසුළු ගතියෙන් වෙව්ලන දුගියන්
අප වෙත එන්නේ කුසගිනි නිවුමට
ජේසුතුමන් නොවැ එලෙසින් එන්නේ

අම්මගේ කිරි රස නොමැතිව හඬනා
කිරි කැටියා සිය දෝතට ගනිමින්
මහ මග අයිනේ සිටිනා මවකින්
ජේසුතුමන් නොවැ අපැ'ස දකින්නේ

දුක් ගිනි මැලයේ පැරුණු සිතකින්
ජීවය තේරුම් නැත යයි සිතමින්
සිටිනා සොහොයුරු සොහොයුරියන් වෙත
ජේසුතුමන් ලෙස සරණය වමුනේ